## 166 – කිතු දෙටු සොහොයුරු

කිතු දෙටු සොහොයුරු පෙරටුව යන්නේ
කුරුසිය ගෙන අපි අනු යම්නේ
මුසු කර අප ඩහදිය සිරි ලෙයටා
වෙහෙසෙමු එක දරු කැල ලෙසටා

බර උසුලන වෙහෙසෙන සත හදටා
සැනසුම සිසිලස දෙන ලෙසටා
වදනින සේවෙන් මේ බව පෙන්නා
දෙනුවට දෙව් පුතු ජනිත වූනා

මව් මරි හට හා සූරුකි පියන්ටා
නිවසෙහි නිරතුරු සහය වුනා
අව් වැසි නොතකා සැරි සරමින්නේ
කුරුසිය තෙක් දහඩිය වගුලේ

කිතු තුම සමගින අපි මෙහෙ කරමු
රට දැය වෙනුවෙන් වෙහෙස වෙමු
ලොව ගලවන්නට ඩහදිය හෙලමු
දෙව් පෙම ඉවසුම ගරු කරමු